# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2024 අංක 3 දරන ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2024 ජනවාරි මස 23 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2024 ජනවාරි මස 26 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 12.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2024 අංක 3 දරන
ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2024 ජනවාරි මස 23 වන දින]

එල්.ඩී.-ඕ. 26/2023

**(122 වන අධිකාරය වූ) ඇටෝර්නි බලපත්‍ර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2024 අංක 3 දරන ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (122 වන අධිකාරය වූ) ඇටෝර්නි බලපත්‍ර ආඥා පනතේ 2 වන වගන්තිය එහි "ඇටෝර්නි බලපත්‍රය" යන යෙදුමේ අර්ථ නිරූපණයේ (ආ) ඡේදයේ සඳහන් "ලියා අත්සන් කරනු ලබන විට, සාක්ෂිකරුවන් දෙදෙනකු ඉදිරියේ සහ තානාපතිවරයකු" යන වචන වෙනුවට "ලියා අත්සන් කරනු ලබන විට, තානාපතිවරයකු" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. 122 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3ඈ වගන්තිය, එහි "කිසිදු තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ අවලංගු කළ නොහැකි" යන වචන වෙනුවට "කිසිදු තැනැත්තකු විසින් අවලංගු කළ නොහැකි" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 3ඈ වන වගන්තිය සංශෝධනය කිරීම

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

"(ආ) අවස්ථාවෝචිත පරිදි, ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ හෝ අවලංගු කිරීමේ සිය අදහස ප්‍රකාශ කරමින් හෝ එම ඇටෝර්නි බලපත්‍රය යටතේ ක්‍රියා නොකිරීමට වන සිය අදහස ප්‍රකාශ කරමින් -

(i) ශ්‍රී ලංකාව තුළ දී වන විට, සාක්ෂිකරුවන් දෙදෙනකු ඉදිරියේ ලියා අත්සන් කර, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සහතික කරනු ලබන ලේඛනයක්; හෝ

(ii) ශ්‍රී ලංකාවෙන් පිටත දී වන විට, තානාපතිවරයකු හෝ මහ කොමසාරිස්වරයකු හෝ 1981 අංක 4 දරන කොන්සල් කර්තව්‍ය පනතේ අර්ථානුකූලව රාජ්‍ය තාන්ත්‍රික නිලධරයකු හෝ කොන්සල් නිලධරයකු හෝ එම රටේ නීතිය අනුව ඇටෝර්නි බලපත්‍රයක් සහතික කිරීමට බලය පැවරී ඇති යම් තැනැත්තකු ඉදිරියේ ලියා අත්සන් කරනු ලබන ලේඛනයක්,

ලියා අත්සන් කළ යුතු ය; සහ".

ප්‍රධාන ප්‍රඥප්තියේ II වන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ II වන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ:-

(3(3) සහ 5 වන වගන්ති)

**II වන උපලේඛනය**

| | | |
|---|---|---|
| 1 | අනු අංකය | |
| 2 | ලියාපදිංචි කළ දිනය | |
| 3 | ඇටෝර්නි බලපත්‍රයේ විස්තරය | |
| 4 | ප්‍රදානකරුගේ නම සහ ලිපිනය | |
| 5 | ඇටෝර්නි බලකරුගේ නම සහ ලිපිනය | |
| 6 | ඇටෝර්නි බලපත්‍රයේ දිනය | |
| 7 | ඇටෝර්නි බලපත්‍රය ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලැබුවේ කා විසින් ද යන වග | |
| 8 | ඇටෝර්නි බලපත්‍රයේ සත්‍ය පිටපත ගොණු කරනු ලබන වෙළුම සහ පත්ඉරුව | |
| 9 | ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ අවලංගු කිරීම සඳහා වන ලේඛනයේ දිනය සහ අංකය | |

| | | |
|---|---|---|
| 10 | ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ අවලංගු කිරීම සඳහා වන ලේඛනය භාරදෙන ලද්දේ කා විසින් ද යන වග | |
| 11 | ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ අවලංගු කිරීම සඳහා වන ලේඛනය ලියාපදිංචි කළ දිනය | |
| 12 | ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ අවලංගු කිරීම සඳහා වන ලේඛනය ලියාපදිංචි කරනු ලබන වෙළුම සහ පත් ඉරුව | |

වලංගුභාවය

**6.** (1) 2022 අංක 28 දරන ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනතේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සහ (2) වන උපවගන්තියේ විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, 2022 ඔක්තෝබර් මස 25 වන දිනට පෙරාතුව ලියා අත්සන් කර, මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින හෝ එදිනට පෙර ලියාපදිංචි නොකරන ලද සෑම ඇටෝර්නි බලපත්‍රයක් ම 2022 ඔක්තෝබර් මස 25 වන දින සිට වසර දෙකක කාලසීමාවක් සඳහා වලංගු බවට සලකනු ලැබිය යුතු අතර, එම වසර දෙකක කාලසීමාව ඇතුළත ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු නොලබන, එම උපවගන්තියේ සඳහන් සෑම ඇටෝර්නි බලපත්‍රයක් ම, එම කාලසීමාව ඉකුත් වීමේ දිනයේ සිට බලාත්මක වන පරිදි ශුන්‍ය සහ බලරහිත බවට සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**7.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.